**කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ ඇති රඹුක්කන ප්‍රාදේශීය රෝහලේ Covid ප්‍රතිකාර ඒකක වල ස්ථාපනය කර ඇති Wall Oxygen සැපයුම් පද්ධතිය හදිසි ප්‍රතිකාර ඒකකය වෙත ස්ථානගත කර ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කොන්දේසි**

පහත අවශ්‍යතාවයන් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් ලංසු අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති.

01. (1). ප්‍රසම්පාදන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියකු හෝ ලියාපදිංචි සමාගමක්, හවුල් ව්‍යාපාරයක් හෝ තනි පුද්ගල ව්‍යාපාරයක් විය යුතු ය.

(2). ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත ලංසු ලියවිලි සමග ඉදිරිපත් කල යුතු ය.

02. **ප්‍රසම්පාදන ගාස්තු**

ප්‍රසම්පාදන ආකෘති පත් ලබාගැනීම සඳහා රු. 250.00 ක ආපසු නො ගෙවන ගාස්තුවක් කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ගෙවා ලබාගත් කුවිතාන්සියක් සියලුම ලංසු කරුවන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

03. **ලංසු ඇපකරය/ආපසු ගෙවන තැන්පත් මුදල**

ලංසු ඉදිරිපත් කිරීමේ දී සියලුම ලංසු කරුවන් රු.40,000.00 ක මුදලක් මේ සමග අමුණා ඇති ඇමුණුම 02 ආකෘති පත්‍රයට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් ලබාගත් 2024.09.30 දින දක්වා වලංගු ලංසු ඇපකරයක් හෝ එම මුදල කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ගෙවා ලබාගත් ලදුපත ප්‍රසම්පාදන මුල් අයදුම් පිටපතට අමුණා ඉදිරිපත් කළ යුතු ය.

04. **ප්‍රසම්පාදන ආකෘති පත්‍ර නිකුත් කිරීම.**

**2024.05.22** දින සිට 2024.06.14 වන දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි දී **පෙ.ව.09.00 සිට ප.ව.02.30 දක්වා** කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේදී ප්‍රසම්පාදන ආකෘති පත්‍ර ලබා ගත හැකි ය.

මෙහි **ඇමිණුම 01 හි** සඳහන් කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු ය. එම ආකෘති නොවන කිසිම ප්‍රසම්පාදන අයදුම්පතක් භාර ගනු නො ලැබේ.

ලංසු පත්වල සියලුම මැකීම් හෝ වෙනස් කිරීම්වලට ලංසු කරු විසින් සිය අත්සන තැබිය යුතු ය. මැකීම් හෝ වෙනස් කිරීම් සඳහා මකන දියර භාවිත නො කල යුතු ය.

05. **මිල ගණන් වලංගු කාල සීමාව**

ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් 2024.09.30 වන දින දක්වා වලංගු විය යුතු ය.

06. **වගකීම් කාලය**

මෙම කර්මාන්තයේ වගකීම් කාලය අවම වශයෙන් වසර 02 (දෙකක්) වත් විය යුතුය.

07. **ලංසු කරුවන් අයදුම්පත් එවිය යුතු අන්දම**

ලංසු කරුවන් විසින් අත්සන් කරන ලද ලංසු අයදුම්පත් පිටපත් දෙකකින් විය යුතු ය. අදාළ සියලු ම සහතික වල මුල් පිටපත් හා ලංසු ඇපකරය කවරයක බහා මුද්‍රා තබා “මුල් පිටපත" යනුවෙන් සඳහන් කළ යුතු ය. දෙවන පිටපත වෙනත් කවරයක බහා “දෙවන පිටපත" යනුවෙන් සඳහන් කර මෙම පිටපත් දෙක ම තවත් එක් කවරයක බහා මුද්‍රා තබා “**රඹුක්කන ප්‍රාදේශීය රෝහලේ Covid ප්‍රතිකාර ඒකක වල ස්ථාපනය කර ඇති Wall Oxygen සැපයුම් පද්ධතිය හදිසි ප්‍රතිකාර ඒකකය වෙත ස්ථානගත කර ගැනීම**” **යනුවෙන් කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කර 2024.06.18 දින පෙ.ව.10.30 ට හෝ ඊට පෙර ලැබෙන ලෙස සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය, කෑගල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එසේ නැති නම් කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගණකාධිකාරී නිල කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලිය හැක.

08. **ලංසු අයදුම්පත් භාර ගැනීම හා විවෘත කිරීම.**

ලංසු පත් භාර ගැනීම අවසන් වූ විගස එනම් **2024.06.18 දින පෙ.ව.10.30** ට කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කර්යාලයේ නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නිල කාමරයේදී ලංසු විවෘත කරනු ඇත. ලංසු අයදුම්පත් විවෘත කරන වේලාවේ දී ලංසු කරුවන්ට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයන්ට පැමිණ සිටිය හැක. නියෝජිතයන් එසේ පැමිණෙන විට ලංසු කරුගේ බලය ලබාගත් ලිපියක් සහ අනන්‍යතාව සනාථ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් කළ යුතු ය. එසේ පැමිණෙන ලංසු කරුගේ බලය ලත් නියෝජිතයින් තමාගේ පැමිණීම සනාථ කිරීම සඳහා ලේඛනයක අත්සන් තැබීම කල යුතු ය.

ලංසු අයදුම්පත් විවෘත කරන නිලධාරි විසින් පැමිණ සිටින ලංසු කරුවන්/නියෝජිතයින් ට ඇසෙන සේ ලංසු කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ මිල ගණන් කියවනු ලැබේ.

09. **පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම පැවැත්වීම**

පූර්ව ලංසු කැඳවීමේ රැස්වීම 2024.06.11 දින පෙ.ව.10.30 ට කෑගල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නිල කාමරයේදී පැවැත්වේ.ඒ සඳහා ලංසු කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැක.

10. **ලංසු ඇගයීම**

ලංසු ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිල්ල දක්වනු ලැබේ.

i. මිල ගනන්

ii. වගකීම් කාලය

iii. අමතර කොටස් වල ගුණාත්මක බව

මෙහි ඉහත සඳහන් කර ඇති කොන්දේසි සම්පූර්ණ කර නැති ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලැබීමට ඉඩ ඇත. සෑම ලංසු පතක් ම භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

.....................................................
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
කෑගල්ල